# මැලිබන් මෙරට වඩාත්ම ආදරය දිනූ බිස්කට් සන්නාමය ලෙස බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් මගින් නම්කෙරේ

වසර 60 කට අධික ඉතිහාසයක් සමගින් යහගුණයෙන් ඉදිරියට යන මැලිබන් බිස්කට් සමාගම මේ වනවිට පරම්පරා ගණනාවක් තිස්සේ මෙරට දොරින් දොර කියැවෙන නාමයක් බවට පත්වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අඛණ්ඩව 3 වැනි වරටත් LMD Brands Annual සඟරාවේ මෙරට වඩාත්ම ආදරය දිනූ සන්නාම 125 අතරට මැලිබන් සන්නාමයද නම්කිරීමට Brand Finance කටයුතු කර ඇති අතර වඩාත්ම කැමති බිස්කට් සන්නාමය ලෙස පත්වී ඇත.

සෑම වසරකදීම Brand Finance ලොව පුරා සන්නාම 3,500 කට අධික සංඛ්‍යාවක් ඇගයීමට ලක්කරයි. එම අගයීමෙහි ප්‍රතිඵල The Banker වැනි ප්‍රකාශන සමග අත්වැල් බැඳගෙන ප්‍රකාශයට පත්කිරීමට එම සමාගම කටයුතු කරන අතර සන්නාම වල වටිනාකම හා ආයෝජන හැකියාවන් ආදිය සම්බන්ධයෙන් ව්‍යාපාරික ලෝකය දැනුවත් කිරීම මෙහි අරමුණ වේ. මීට සමගාමීව Brand Finance හි මෙරට කාර්යාලය මගින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සන්නාම සම්බන්ධයෙන් විවිධ කාණ්ඩ යටතේ ඇගයීමක් සිදුකරයි.

***"මැලිබන් සමාගමේ නිර්මාතෘතුමන්ගේ දැක්ම අනුව යමින්, සෑම විටම ඉහළම තලයේ රසයෙන් සහ ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත තිළිණ කිරීම අපගේ අරමුණයි." කුමුදිකා ප්‍රනාන්දු - කළමනාකාර අධ්‍යක්ෂ***

මේ පිළිබඳව අදහස් දක්වමින් මැලිබන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ කුමුදිකා ප්‍රනාන්දු මහත්මිය මෙසේ පැවසුවා ය. "මැලිබන් සමාගමේ නිර්මාතෘතුමන්ගේ බේකරිය කොටහේන ප්‍රදේශයේ ආරම්භ වූ දා පටන්ම උත්සාහ කරන්නේ ඉහළම තලයේ රසයෙන් සහ ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත තිළිණ කිරීමටයි. පසුකාලීනව අපගේ පර්යේෂණ හා සංවර්ධන කණ්ඩායම් නැවුම් නිෂ්පාදන රාශියක් වෙළඳපොළට හඳුන්වා දීමට සමත් වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් මෙරට සෙසු බිස්කට් සන්නාම අභිභවා අපගේ සන්නාමය ඉහළින්ම ශ්‍රේණිගත කර තිබීමෙන් පෙනී යන්නේ අපගේ අරමුණු සැබැවින්ම සාර්ථක වී ඇති බවයි. මේ වනවිට සමාගමේ සභාපති ලෙස කටයුතු කරන රත්නපාල සමරවීර මහතා සමාගමේ ආරම්භක යහ ගුණධර්ම වලින් හෙබි මූලධර්මයන් අඛණ්ඩව පෙරට ගෙනයාමට කටයුතු කරමින් සිටිනවා."

***"අපගේ සාර්ථකත්වයේ රහස වන්නේ පාරිභෝගිකයන් වෙනුවෙන් අඛණ්ඩව නව නිෂ්පාදන හඳුන්වා දීමයි." රවී ජයවර්ධන මහතා - සමූහ ප්‍රධාන විධායක නිලධාරී***

"ශ්‍රී ලංකාවේ උරුමයක් බඳු සන්නාමයක් වන මැලිබන් පරම්පරා ගණනාවක් තිස්සේ පාරිභෝගිකයන්ගේ රුචිකත්වයන් නිවැරදිව හඳුනාගනිමින් ඒ සඳහා ගැළපෙන නිෂ්පාදන තිළිණ කරමින් සිටිනවා. 2018 වසරේදී අප තරුණ පරපුර වෙනුවෙන් සැබෑ කෝපි වල රසය සහ ප්‍රබෝධමත්බව කැටිකරගත් ප්‍රණීත කෝපි ක්‍රීම් සහිත මැලිබන් රියල් ටෙම්ප්ටේෂන් කොෆී මෙන්ම මැලිබන් ගෝල්ඩන් ක්‍රීම් පෆ් සහ මැලිබන් ෆලූඩා මාරි වැනි නැවුම් නිෂ්පාදන හඳුන්වා දුන්නා. ඒ වගේම දරුවන්ට රසය හා පෝෂණය ලබාදෙන අතරම ඔවුන්ට ඉංග්‍රීසි හෝඩිය දැනුම ලබාගැනීමටත් ඒ ඇසුරින් වචන නිර්මාණය කිරීමටත් හැකිවන ආකාරයට Maliban ABC Learnies හඳුන්වා දීමට අප කටයුතු කළා." මැලිබන් සමාගමේ සමූහ ප්‍රධාන විධායක නිලධාරී රවී ජයවර්ධන මහතා සිහිපත් කළේ ය.

නිරන්තරයෙන් තම තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කරන මැලිබන් සමාගම ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුව තම නිෂ්පාදන නිපදවයි. තවද තම කාර්ය මණ්ඩලයට ක්ෂේත්‍රය තුළ පෙරමුණේ සිටීමට උපකාරී වන උසස් තත්ත්වයේ පුහුණුවක් ලබාදීමටද සමාගම කටයුතු කරයි.

මසකට බිස්කට් ඇසුරුම් මිලියන 25 කට අධික ප්‍රමාණයක් නිපදවා රටවල් 35 ක් වෙත බෙදාහරින මැලිබන් සමාගම තම නිෂ්පාදන නිපදවනු ලබන්නේ පවිත්‍රතාව සම්බන්ධ දැඩි ප්‍රමිතීන් අනුගමනය කරමිනි. ISO 9001, ISO 14001, ISO 22000 සහ OHSAS 18001 සහතිකකරණයන්ට අමතරව එය කිහිප වරක්ම ජාතික තත්ත්ව සම්මානද දිනාගෙන ඇත. Asia Pacific Quality Organization (APQO) මගින් පිරිනමන මහා පරිමාණ සමාගම් කාණ්ඩයේ 'Global Performance Excellence Awards' සම්මාන සහ බෙල්ජියමේ International Taste and Quality Institute (ITQI) මගින් Master Chefs Society (WMCS) සහ Association de la Sommelier International (ASI) යන සංවිධාන වල සාමාජිකයන්ගේ විනිශ්චයන් අනුව පිරිනමනු ලබන සුවිශේෂී 'The Superior Taste Award' සම්මානය යනාදී ජාත්‍යන්තර සම්මාන හා ඇගයුම් වලින්ද පිදුම් ලබා ඇති මැලිබන්, රසය සහ ප්‍රමිතිය සම්බන්ධයෙන් එබඳු ඇගයුම් වලින් පිදුම් ලැබූ මෙරට එකම ආහාර සන්නාමයද වේ.

**- අවසානයි -**